# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## මධ්‍ය වාර්ෂික පරීක්ෂණය - 2018

| 11 ශ්‍රේණිය | භූගෝල් විද්‍යාව | I පත්‍රය | කාලය පැය 1 යි |
|---|---|---|---|

**නම :-** ..........................................................................................................

**සැළකිය යුතුයි.**

**i.** **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විතය.**

**ii.** **සපයා ඇති උපදෙස් අනුව මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

**01 සිට 10 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. භෞම පද්ධතිය තුළ ජලය හුවමාරු වීමේ ක්‍රියාවලිය ............................නම් වේ.
(වාෂ්පීකරණය / වර්ෂණය / ජලචක්‍රය)

02. ද්‍රවමය ලෝහ සහ ඝන යකඩවලින් සමන්විත පෘථිවි ස්ථරය ...........................ලෙස හඳුන්වයි.
(හරය / කබොල / ප්‍රාවරණය)

03. ඕස්ට්‍රේලියාව අයත් මහද්වීපික තටකය තුළ .................................ද්වීපත පිහිටා ඇත.
(පැපුවා නිව්ගිනියාව / තායිවානය / සීෂෙල්ස්)

04. බටහිර යුරෝපයේ රටවල් අතුරෙන් ........................ව්‍යාපාරික කිරි පට්ටි පාලනයට ප්‍රසිද්ධියක් උසුලයි.
(ඉතාලිය / ප්‍රංශය / ඩෙන්මාර්කය)

05. ශ්‍රී ලංකවේ වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාවක් .........................ප්‍රදේශයේ පිහිටුවා ඇත.
(හම්බන්තොට / පල්ලෙකැලේ / පොල්ගහවෙල)

06. පොසිල ඉන්ධන, ස්වාභාවික සම්පත් අතර.......................................... සම්පතකි.
(ඉන්ධනමය / ලෝහමය / ලෝහ නොවන)

07. ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග පර්යේෂණායතනය ..............................පිහිටුවා ඇත.
(මහනුවර / මාතලේ /හම්බන්තොට)

08. කෙරවළපිටිය හා නොරොච්චෝලේ යන ස්ථානවල .............................විදුලි බලාගාර පිහිටුවා ඇත.
(සූර්ය / තාප / සුළං)

09. 2012 ජන සංගණනයට අනුව ශ්‍රී ලංකාවේ ඉහළම ජනසංඛ්‍යා වර්ධන අනුපාතිකයක් පෙන් වූ දිස්ත්‍රික්කය ...................................යි.
(කොළඹ / නුවරඑළිය / අනුරාධපුරය)

10. ......................................ශ්‍රී ලංකාවේ දැඩි ස්වාභාවිත රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.
(හෝර්ටන්තැන්න / විල්පත්තුව / රිටිගල)

**11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය කියවා බලා එය නිවැරදි නම් "නි" යන්න වටාද වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.**

11. සුළං බලය පරිසරය දූෂණය අවම මට්ටමක ඇති බල ශක්ති මූලය කි. (නි/වැ)

12. උපත්, මරණ හා ශුද්ධ සංක්‍රමණ ලෝක ජන සංඛ්‍යාව වෙනස් වීමට බලපාන සාධක වේ. (නි/වැ)

13. පෘථිවියේ හරය හා ප්‍රාවරණය අතර මොහොරෝවිසික් අසන්තතිය පිහිටා ඇත. (නි/වැ)

14. ඉන්දු - ශ්‍රී ලංකා දේශසීමාවට අයත් මන්නාරම් මුහුදු කලාපය, පෝක් සමුද්‍ර සන්ධිය හා බෙංගාල බොක්ක යන කලාපයේ මුහුදු සීමාව ඓතිහාසික ජල ප්‍රදේශය ලෙස හැඳින්වේ. (නි/වැ)

15. ශිලා ගෝලයේ භූ තැටි අතරින් පැසිපික් තැටිය මූලික වශයෙන් මහාද්වීපික තැටියකි. (නි/වැ)

**අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවා සම්බන්ධතාව අනුව ගැළපූ විට නිවැරදි පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.**

16. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ඛනිජ වර්ග කීපයක් ''අ'' තීරුවේද ඒවායින් සිදු කරන නිෂ්පාදන ''ආ' තීරුවේ ද දැක්වෙන අතර ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | "අ" | | | "ආ" |
|---|---|---|---|---|
| 1. | රූටයිල් | A | - | ඔරලෝසු බෙයාරින් |
| 2. | මිනිරන් | B | - | පිඟන් භාණ්ඩ |
| 3. | මැණික් | C | - | වාත්තු අච්චු |
| 4. | සිලිකා වැලි | D | - | තීන්ත නිෂ්පාදන |

i. BCDA ii. CDAB iii. CBDA iv. DCBA (……)

17. ලෝකයේ ප්‍රධාන විල් කිහිපයක් ''අ'' තීරයේ ද ඒවා පිහිටි මහාද්වීපය ''ආ'' තීරයේ ද දැක්වේ. ''අ'' සහ ''අ'' තීර නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | "අ" | | | "ආ" |
|---|---|---|---|---|
| 1. | බයිකල් විල | A | - | උතුරු ඇමරිකාව |
| 2. | අයර් විල | B | - | අප්‍රිකාව |
| 3. | සුපිරියර් විල | C | - | ඔස්ට්‍රේලියාව |
| 4. | වික්ටෝරියා විල | D | - | ආසියාව |

i. ACDB ii. BDCA iii. CDAB iv. DCAB (……)

18. නිවර්තන වාසුළි ප්‍රාදේශීයව හඳුන්වන නම් ''අ'' තීරයේ ද ඒවා ඇතිවන ප්‍රදේශ ''ආ'' තීරයේ ද දැක්වේ' ''අ'' සහ ''ආ'' තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | "අ" | | | "ආ" |
|---|---|---|---|---|
| 1. | ටයිෆූන් | A | - | මෙක්සිකෝ බොක්ක |
| 2. | හරිකේන් | B | - | උතුරු පැසිෆික් සාගරය බටහිර |
| 3. | බැගියෝ | C | - | උතුරු ඕස්ට්‍රේලියානු වෙරළ |
| 4. | විලි විලිස් | D | - | පිලිපීන දූපත් ආශ්‍රිත |

i. ABCD ii. ACBD iii. BADC iv. BDAC (……)

19. වායුගෝලීය ස්තරවල විශේෂ ලක්ෂණ කිහිපයක් ''අ'' තීරයේද එම ලක්ෂණ දැකිය හැකි වායුගෝලීය ස්තර ''අ'' තීරයේද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීර නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| | "අ" | | | "ආ" |
|---|---|---|---|---|
| 1. | විද්‍යුත් ක්‍රියාවලීන් බහුලව සිදුවේ | A | - | තාපගෝලය |
| 2. | ඕසෝන් ස්තරය පිහිටා ඇත | B | - | පරිවර්තී ගෝලය |
| 3. | සාමාන්‍ය පතන සීඝ්‍රතාව | C | - | මෙසෝ ගෝලය |
| 4. | උෂ්ණත්වට ඉතා අධිකය | D | - | අපරිවර්තී ගෝලය |

i. BCAD ii. CDBA iii. CBDA iv. BDCA (……)

20. ශ්‍රී ලංකාවේ වනජීවී රක්ෂිත ප්‍රදේශ කීපයක් ''අ'' තීරුවේද ඒවා අයත් රක්ෂිත වර්ගය ''ආ'' තීරුවේද දැක්වේ. ''අ'' සහ ''ආ'' තීරු නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

| ''අ'' | | ''ආ'' |
|---|---|---|
| 1. සිංහරාජය | A | - ජාතික උද්‍යාන |
| 2. වික්ටෝරියා | B | - දැඩි ස්වාභාවික රක්ෂිත |
| 3. හෝර්ටන් තැන්න | C | - අභය භූමි |
| 4. යාල | D | - වනරක්ෂිත |

i. ABCD ii. BCDA iii. CDBA iv. DCAB (……)

**21 සිට 25 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

21. නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්කවල ……………………………ක්‍රමයට වී වගා කරයි

22. උතුරු අක්ෂාංශ $23\frac{1^0}{3}$…………………..නිවර්තනය ලෙස හඳුන්වයි.

23. මුහුදු මට්ටමෙන් කිලෝමීටර 12 සිට 50 දක්වා උසක විහිදෙන වායුගෝලීය කලාපය ……………………..නමින් හැඳින්වේ.

24. වර්ෂාවෙන් හා ජලසම්පාදනයෙන් පොළොවට කාන්දු වී තැන්පත් වන ජලය …………………නම් වේ.

25. හුණුගල්, ගල් අඟුරු හා ජිප්සම් ……………………………පාෂාණවලට නිදසුන්ය.

**අංක 26 සිට 28 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා දී ඇති ශ්‍රී ලංකා සිතියම යොදාගන්න.**


26. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාපයක පිහිටි සීගිරිය ………………………අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

27. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධීවර වරායක් වන ත්‍රිකුණාමලය වරාය …………… අක්ෂරයෙන් දක්වා ඇත.

28. ජාතික උද්‍යානයක් වන ''සෝමාවතිය'' ………………අක්ෂරයෙන් දැක්වෙන දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.




**අංක 29 සහ 30 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත ප්‍රස්තාරය උපයෝගී කරගන්න.**




චීනයේ විද්‍යුත් නිෂ්පාදන ආදායමෙහි වර්ධනය 2000-2010

29. චීනයේ වැඩිම විද්‍යුත් නිෂ්පාදන ආදායම RMB බිලියන………………………….. කි.

30. විද්‍යුත් නිෂ්පාදන ආදායම RMB බිලියන 1000ට අඩුවෙන් ලබාගත් වර්ෂය ……………………යි.

**ප්‍රශ්න අංක 31 සිට 40 දක්වා ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදිව හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියා දක්වන්න.**

31. ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ප්‍රධාන ගංගා ද්‍රෝණි නිම්න ප්‍රමාණය කොපමණද?
i. 101 ii. 102 iii. 103 iv. 104 (……)

32. නල්ලබාර් තැන්න පිහිටා ඇත්තේ,
i. ඕස්ට්‍රේලියාවේ ය ii. ඉන්දියාවේ ය
iii. දකුණු අප්‍රිකාවේ ය iv. රුසියාවේ ය (……)

33.
- 300mm හා 500mm අතර වර්ෂාපතනය,
- පැල වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය
- හොඳින් ජලය බැස යන තැනිතලා බිම්
- චර්නෝසම් පස

ඉහත සඳහන් භෞතික සාදක වැදගත් වන්නේ කිනම් වගාවක් සඳහාද
i. වී ii. බාර්ලි iii. තිරිඟු iv. මිලට් (……)

34. ශ්‍රී ලංකාවේ කිරිගව සම්පත් හුවමාරු කර ගැනීම සඳහා සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවා ඇති ස්ථානය වන්නේ,
i. අඹේවෙල ය ii. කන්නවිල ය
iii. වල්පිට ය iv. මීවනපලාන ය (……)

35. අර්ධ වශයෙන් ගොඩබිමෙන් වට වූ මුහුදු පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,
i. කළු මුහුද, රතු මුහුද ii. කළු මුහුද, එරල් මුහුද
iii. රතු මුහුදු, එරල් මුහුද iv. මධ්‍යධරණී මුහුද, එරල් මුහුද (……)

36. සමෝච්ඡ රේඛා ඉතාමත් ආසන්නව එක මත එක වැටෙන තරමට සමීපව පිහිටා තිබෙන බෑවුම වනුයේ,
i. උත්තල බෑවුම ii. මොහොර බෑවුම
iii. කඳු බෑවුම iv. අවතල බෑවුම (……)

37. ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම අතර ස්පර්ශ උරුමයන් සහ අස්පර්ශ උරුමයන් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
i. වනෝද්‍යාන - මානව දයාව ii. ආගන්තුක සත්කාර පෞරාණික නගර
iii. සීගිරිය - දළදා මාලිගාව iv. කාරුණික බව - මානව ගරුත්වය (……)

38. සැබෑ භූමියේ දුර කිලෝමීටර එකකින් දැක්වෙන ප්‍රදේශයක් 1:50,000 පරිමාණයට අඳින ලද සිතියමක නිරූපණය වනුයේ සෙන්ටිමීටර,
i. එකකිනි ii. දෙකකිනි
iii. තුනකිනි iv. හතරකිනි (……)

39. ලෝකයේ උසම සානුව ආසියා මහාද්වීපයේ පිහිටි,
i. පාමීර් සානුව ii. ඩෙකෑන් සානුව
iii. ටිබෙට් සානුව iv. මහවලතැන්න සානුව (……)

40. විශ්ව විද්‍යාල හා සම්බන්ධ පර්යේෂණායතන ආශ්‍රිතව ස්ථානගතවීම විශේෂ ලක්ෂණයක් වනුයේ පහත කවර කර්මාන්තයකද?
i. මෝටර් රථ ii. රෙදිපිළි
iii. ගුවන් යානා iv. විද්‍යුත් (……)

**(ලකුණු 1 x 40 = 40)**